ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# සීමාවාසික පුහුණු වැඩසටහන

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන සීමාවාසික පුහුණු වැඩසටහන සඳහා ස්වෙච්ඡාවෙන් සහභාගී වීමට කැමැත්ත දක්වන උපාධි අපේක්ෂකයන්, නව උපාධිධාරීන් හෝ සමාන සුදුසුකම් ඇති පුද්ගලයන් (වයස අවු 19-29 අතර) වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම වැඩසටහන මානව හිමිකම් සහ ඒ ආශ්‍රිත විෂයයන්/ගැටළු, මෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සහ එහි අනිවාර්ය විධිවිධාන කෙරෙහි අවධානය යොමු කරයි.

සීමාවාසික පුහුණු වැඩසටහන මාස 03ක කාල පදනමක් මත ක්‍රියාත්මක වන අතර මාස 03කට වරක් නව කණ්ඩායමක් බඳවා ගැනේ. බඳවා ගන්නන්ගේ සහ කොමිෂන් සභාවේ අන්‍යෝන්‍ය එකඟතාවයකින් සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අනුමැතියෙන් පසු ඔවුන්ගේ සීමාවාසික කාලය දීර්ඝ කළ හැකිය. නීතිය, දේශපාලන විද්‍යාව, ජාත්‍යන්තර සබඳතා හෝ සමාජ විද්‍යාව හා මානව ශාස්ත්‍රය යන විෂයන්ට හා අදාළ අනෙකුත් ක්ෂේත්‍රවල උපාධි අපේක්ෂකයින්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

මේ සඳහා **2026 ජනවාරි 06** වන දිනට ප්‍රථම අයදුම් කළ යුතුවේ.

කරුණාකර මෙම පණිවිඩය ඔබේ විශ්වවිද්‍යාලයේ/ආයතනයේ/පීඨවල/දෙපාර්තමේන්තු වල සිසුන් අතර ප්‍රචාරය කිරීමට සලස්වන මෙන් ඉල්ලා සිටිමු. මේ සම්බන්ධයෙන් ඔබගේ සහයෝගය බෙහෙවින් අගය කරනු ලැබේ.

ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව